www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සාම සාකච්ඡා බිඳ වැටීමේ අද්දර

## Sri Lankan peace talks on the verge of collapse

**නන්ද වික්‍රමසිංග සහ කේ. රත්නායක විසිනි**
**2006 අප්‍රේල් 19**

ශ්‍රී ලංකාවේ උතුරේ හා නැගෙනහිර යුද කලාප තුල ප්‍රචන්ඩ ක්‍රියා උත්සන්න වන තතු යටතේ, ආන්ඩුව සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර ජිනීවා සාම සාකච්ඡා බිඳ වැටීමේ අද්දරට පැමින තිබේ. අප්‍රේල් මුල සිට මේ දක්වා මිලිටරි භටයන්, එල්ටීටීඊ කේඩර සහ සිවිල් වැසියන් ඇතුලු 70ක් පමන දෙනා ඝාතනය කෙරී ඇත. තවත් බොහෝ සංඛ්‍යාවක් තුවාල ලබා සහ දහස් ගනනක් අවතැන්ව ඇත.

දෙවන වටයේ සාකච්ඡා අද ඇරඹීමට නියමිතව තිබූ නමුත් ජිනීවා කතාවලට පෙරාතු සාකච්ඡා සඳහා නැගෙනහිර සිට උතුරේ එල්ටීටීඊ බල ප්‍රදේශයට එල්ටීටීඊ කේඩර ප්‍රවාහනය කිරීම පිලිබඳව හටගත් මතභේදයකට අනතුරුව එම සාකච්ඡා අප්‍රේල් 24-25 තෙක් කල් දමා තිබේ. ආරක්ෂක අමාත්‍යංශය, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ද සහයෝගය සහිතව, ගුවන් හමුදාව මගින් ප්‍රවාහන පහසුකම් සැපයීම පිලිබඳ එල්ටීටීඊයේ ඉල්ලීම, ප්‍රකෝපකාරි ලෙස ප්‍රතික්ෂේප කලේ ය. මෙය මීට පෙර එල්ටීටීඊයට සපයන ලද පහසුකමකි.

ආන්ඩුව, ජාත්‍යන්තර පීඩනය යටතේ, සද්චේතනාවේ සලකුනක් ලෙස පුද්ගලික හෙලිකොප්ටරයක් කුලියට ගැනීමේ අවසරය දීමට අවසානයේ එකඟ වී ඇත. ඊට පෙරාතුව මුහුදු මාර්ගය භාවිත කිරීමේ එල්ටීටීඊයේ ප්‍රයත්න බිඳ වැටී තිබුනි. කෙසේ වෙතත්, සාකච්ඡා ඉදිරියට යාම පිලිබඳ කිසිදු සහතිකයක් නැත.

"ජිනීවා සාකච්ඡාවලට සහභාගි වීමෙන් අපව වලක්වන බාධා ඉවත් කොට සුදුසු වාතාවරනයක් නිර්මානය කෙරෙන තෙක්" සාකච්ඡාවලට සහභාගි වීමේ හැකියාවක් එල්ටීටීඊයට නැතැයි, එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක එස්.පී. තමිල්චෙල්වම් සඳුදා නෝර්වේජියානු තානාපති වෙත යැවූ ලිපියක සඳහන් කලේ ය.

ඊයේ රොයිටර් ප්‍රවෘත්ති සේවය වෙත කල අදහස් දැක්වීමක දී, එල්ටීටීඊ සාම ලේකම් කාර්යාලයේ ප්‍රධානි එස්. පුලිදේවන්, "අපගේ ජනතාව මරා දමන අතර අපගේ වෙලඳ සැල් කොල්ල කන අතර අපි ජිනීවා නොයන්නෙමු." යැයි පවසමින්, තවත් දුර ගිය බවක් පෙන්නුම් කලේ ය. ප්‍රචන්ඩ ක්‍රියා අවසානයකට ගෙන ඒම ගැන හෙට නෝර්වේජියානු සාම නියෝජිත ජොන්-හැන්සන් බවර් සමග සාකච්ඡා කිරීම එල්ටීටීඊයේ අභිප්‍රාය වන බව ද ඔහු ඇඟවී ය.

බවර්, ජිනීවා සාකච්ඡා සඳහා එකඟතාවක් අටවා ගැනීමට උත්සාහ කරනු පිනිස සති දෙකක් ඇතුලත දෙවන වතාවට ඊයේ ශ්‍රී ලංකාවට පැමිනියේ ය. නෝර්වේ වනාහි සාම ක්‍රියාදාමයේ නිල පහසුකම් සපයන්නා ය. 2002 සටන් විරාම ගිවිසුම අධීක්ෂනය කරන නෝර්වේජියානු නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්), සඳුදා සංශයවාදී ලෙස අනතුරු අඟවමින් කියා සිටියේ, ශ්‍රී ලංකාවේ තත්වය පාලනයෙන් ගිලිහෙමින් පවතින බව යි.

"දැනටමත් මිනිස්සු විශාල වසයෙන් මිය යමින් තිබේ. එබැවින් තත්වය දැරිය නොහැකි ය. මේ ආකාරයෙන් දිගට ම යාමේ හැකියාවක් අපට නැත. ප්‍රහාර එල්ල කෙරෙන්නේ මක් නිසා ද ඒවා එල්ල කරන්නේ කවුද යන්න ගැන සමපෙක්ෂනය කිරීම හා හිත හිතා ඉඳීම වෙනුවට පාර්ශ්වයන් මෙම හිර වීමෙන් ගැලවීමේ මාවතක් සොයා ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය ය." යැයි එස්එල්එම්එම් ප්‍රකාශක හෙලන් ඔලෆ්ස්ඩොටිර් පැවසී ය.

යුද තර්ජනය පිලිබඳව අනතුරු ඇඟවීමේ සංඥාවක් ලෙස, පාස්කු නිවාඩුව තුල දී කොලඹ කොටස් වෙලඳ පොලේ රුපියල් බිලියන 30ක (එ.ජ. ඩොලර් මිලියන 300ක) වටිනාකම් අතු ගෑවී ගියේ ය. සමස්ත කොටස් මිල දර්ශකය සියයට 4කින් නැත හොත් ඒකක 100කින් පහල වැටුනි. "ප්‍රචන්ඩ ක්‍රියා ඉහල නැගීම සහ ජිනීවා සාකච්ඡා පිලිබඳ පවතින සැක සංකා පවත්නා තතු යටතේ, දර්ශක දෙකෙහිම තියුනු වැටීම්වලට තුඩු දෙමින් ආයෝජකයන් විශාල වසයෙන් කොටස් විකුනා දැමීමට පෙලඹී ඇත." යැයි ජෝන් කීල්ස් කොටස් තැරව්කරුවෝ පැවසූ හ.

වත්මන් බිඳෙන සුලු සටන් විරාමය වෙනස් කල යුතු යැයි කොලඹ පාලනය අවධාරනය කල හොත් තමන් සාකච්ඡාවෙන් ඉවත් වන බවට එල්ටීටීඊ නියෝජිත කන්ඩායම තර්ජනය කිරීමෙන් අනතුරුව, පෙබරවාරි 22-23 දිනවල ජිනීවාහි පැවති පලමු වටයේ සාකච්ඡා -- 2003 අප්‍රේල් මස සාකච්ඡා අත්හිටුවීමෙන් පසුව ප්‍රථම වතාවට පැවති සාකච්ඡා -- බිඳ වැටීමේ අද්දරට

ම පැමිනියේ ය. තියුනු ජාත්‍යන්තර පීඩනය යටතේ, සටන් විරාමය රැකීමටත් තව දුර සාකච්ඡා පැවැත්වීමටත් දෙපාර්ශ්වය ම අවසානයේ එකඟ වූහ.

කෙසේ වෙතත්, සටන් විරාම ගිවිසුම සංශෝධනය කිරීමටත් නෝර්වේ රාජ්‍යය සාම ක්‍රියාදාමයේ පහසුකම් සැපයීමේ භූමිකාවෙන් ඉවත් කිරීමටත් රාජපක්ෂ ආන්ඩුව අපොහොසත් වීම සම්බන්ධයෙන්, එය සිය දේශපාලන සගයන්ගේ -- සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සහ ජාතික හෙල උරුමයේ -- දැඩි ප්‍රහාරයට ක්ෂනිකව ලක් විය. සුලුතර ආන්ඩුවට තීරනාත්මක පාර්ලිමේන්තු පිටුබලය සපයන්නා වූ ද පසු ගිය නොවැම්බර් ජනාධිපතිවරනයේ දී රාජපක්ෂට සහයෝගය දුන්නා වූ ද ජවිපෙ සහ හෙල උරුමය සටන් විරාමයත් නෝර්වේ රාජ්‍යයත් එල්ටීටීඊ-ගැති බවත් ශ්‍රී ලංකාවේ ස්වෛරී භාවයට වල කපන බවත් කියමින් ඒවාට පහර දෙති.

මිලිටරියේ ඉහල නිලධාරින් ද සටන් විරාමය විවෘතව විවේචනය කර තිබේ. සන්නද්ධ හමුදාවල කොටස්, විශේෂයෙන් ම මිලිටරි ඔත්තු සේවාවන්, දෙමල පැරා-මිලිටරි කන්ඩායම් සමග, විශේෂයෙන් ම කරුනා නොහොත් වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් නැගෙනහිර පලාතේ එල්ටීටීඊයෙන් බිඳී ගිය කන්ඩායමක් සමග, රහසේ සහයෝගී වී ඇත. ජිනීවාහි පැවති පලමු වටයේ සාකච්ඡාවල දී, මෙම පැරා-මිලිටරි කන්ඩායම් නිරායුධ කිරීම පිලිබඳ සටන් විරාම අවශ්‍යතාව ක්‍රියාවට දැමීමට කොලඹ ආන්ඩුව එකඟ වූ නමුත් එම පොරොන්දුව ඉටු කිරීමෙහි ලා කිසිවක් සිදු කොට නැත.

පෙබරවාරි සාකච්ඡා තුල දී සහ එයින් ක්ෂනිකව ඉක්බිතිව ප්‍රචන්ඩ ක්‍රියාවන්ගේ යම් අඩු වීමක් දක්නට ලැබුනු නමුත් උතුරු හා නැගෙනහිර පලාත්වල අප්‍රකාශිත යුද්ධයකට සම වන තත්වයක් යලිත් වැඩෙමින් පවතී. තමන් කරුනාට සහ සෙසු පැරා-මිලිටරි කන්ඩායම්වලට සහාය දෙන බවත් ඔවුන් ආන්ඩුවේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල ක්‍රියාත්මක වන බවත් මිලිටරිය තරයේ ප්‍රතික්ෂේප කරයි. එහෙත්, සිද්ධීන් කෙතරම් එලිදරව් වන සුලු ද කිය තොත් සටන් විරාම නිරීක්ෂන කමිටුවට ද ඒ පිලිබඳව අදහස් දැක්වීමට බල කෙරී ඇත.

මාර්තු 25 දා වයඹ දිග මුහුදේ දී නාවික භටයන් අට දෙනකු මරුමුවට පත් කරමින් ට්‍රෝලර් යාත්‍රාවක් පිපිරවීම හෙලා දකිමින් ප්‍රකාශයක් නිකුත් කරන සටන් විරාම නිරීක්ෂන කමිටුව, පැරා-මිලිටරි කන්ඩායම්වලට එරෙහිව ක්‍රියාත්මක වීමට අපොහොසත් වීම ගැන ආන්ඩුවට ද දොස් නැගී ය. යුද හමුදාපති සරත් ෆොන්සේකා කල ප්‍රකාශ අභියෝගයට ලක් කරමින්, සටන් විරාම නිරීක්ෂන කමිටුවේ ප්‍රධානි හැග්‍රප් හෝක්ලන්ඩ් සන්ඩේ ටයිම්ස් පත්‍රයට මෙසේ පැවසී යः "ඔව් අපි ඔවුන් (පැරා-මිලිටරි කන්ඩායම්) හමු වුනා, ඔවුන් සමග කතා කලා." මෙම කන්ඩායම්වලට හමුදාවේ සහාය ලැබෙන බවට තමන්ට කිසිදු සාක්ෂියක් නැති බව පිලිගන්නා අතර ම හෝක්ලන්ඩ් මෙසේ ද ප්‍රකාශ කලේ යः "ඔවුන් ක්‍රියාත්මක වන්නේ ආන්ඩුවේ පාලනය යටතේ පවත්නා ප්‍රදේශවල නො වේ යැයි යුද හමුදාපති පැවසීම වරදක් බව මම කනගාටුවෙන් වුව ද පවසමි.

ආන්ඩුව හා මිලිටරිය කෙතරම් ප්‍රතික්ෂේප කලත්, පැරා-මිලිටරි කන්ඩායම්වලට ඔවුන් දේශපාලනිකව සහයෝගය දක්වන බව පැහැදිලි ය. අප්‍රේල් 10 දා, තමිලීල මක්කල් විඩුතලෙයි පුලිගල් (දෙමල ඊලම් මහජන විමුක්ති කොටි) නමින් හැඳින්වෙන කරුනා කන්ඩායමේ දේශපාලන අංශය, ප්‍රථම වතාවට මඩකලපුවේ ප්‍රසිද්ධ කාර්යාලයක් විවෘත කලේ ය. එම උත්සවය පැවැත්වුනේ දැඩි පොලිස් හා මිලිටරි මුරකාවල් යටතේ ය.

අප්‍රේල් 7 දා එල්ටීටීඊ-හිතැති ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ දෙමල මහජන සංසදයේ සභාපති වී. විග්නේස්වරන් ඝාතනය කිරීමේ ප්‍රකෝපකාරී ක්‍රියාවට පසුව, වත්මන් ප්‍රචන්ඩ ක්‍රියා වටය උත්සන්න විය. නාඳුනන තුවක්කුකරුවකු විසින් ත්‍රිකුනාමලයේ දී ඔහු වෙඩි තබා ඝාතනය කරන ලදි. විග්නේස්වරන්, පසු ගිය දෙසැම්බරයේ දී නාඳුනන තුවක්කුකරුවකු විසින් ඝාතනය කරන ලද එල්ටීටීඊයට හිතවත් පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝශප් පරරාජසිංහම්ගේ තනතුරට පත් වීමට නියමිතව තිබුනි.

විග්නේස්වරන්ගේ ඝාතනය සිදු වූයේ හමුදා මුරපොලවලට මෙන් ම නාවික හමුදා අන දෙන මධ්‍යස්ථානයකට ද සමීපව මිලිටරි අධි ආරක්ෂක කලාපයක් තුල ය. එහෙත් ඝාතකයා අත් අඩංගුවට ගෙන නැත. තමන් මෙම සිද්ධියට කොහෙත්ම සම්බන්ධ නැතැයි මිලිටරිය ප්‍රකාශ කල අතර ආන්ඩුව ඝාතනය හෙලා දැකීමේ ආකාරගත ප්‍රකාශයක් නිකුත් කලේ ය. මෙම ඝාතනය "හමුදාවේ සහ එහි ඔත්තු සේවා ක්‍රියාකාරින්ගේ" වැඩක් යැයි එල්ටීටීඊය ප්‍රකාශ කලේ ය. මේ සමබන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන් වුවත්, ඔවුන්ගේ එල්ලය වූයේ පැහැදිලිව ම ප්‍රචන්ඩ ක්‍රියා අවුලුවා එලඹෙන ජිනීවා සාකච්ඡා කඩාකප්පල් කිරීම යි.

ඉන් තුන් දිනක් ඇවෑමෙන්, නැග එන මහජන හමුදාව නමින් තමන්ව හඳුන්වා ගන්නා කන්ඩායමක්, යාපන අර්ධද්වීපයේ මිරුසුවිල්හි දී ට්‍රක් රථයක ගමන් කරමින් සිටි සොල්දාදුවන් පස් දෙනෙකු ඝාතනය කල ක්ලේමෝර් බෝම්බයක් පිපිරවීම පිලිබඳ වගකීම භාර ගත්තේ ය. අප්‍රේල් 11 දා ත්‍රිකුනාමලයේ දී සිදුවූ තවත් බෝම්බ පිපිරීමක දී, නාවික භටයන් 11ක් ඝාතනය

කෙරී අට දෙනෙක් තුවාල ලැබී ය. මෙම ක්‍රියාවන්ට තමන්ගේ සම්බන්ධයක් නැති බවට එල්ටීටීඊය නිල වසයෙන් ප්‍රකාශ කලත්, එම ප්‍රහාර සඳහා ඔවුන් අන දුන් බවට සැකයක් නැති තරම් ය. උතුරු හා නැගෙනහිර පලාත් පුරා ප්‍රහාර සහ ප්‍රති-ප්‍රහාර දැන් සාමාන්‍ය සිද්ධීන් බවට පත්ව ඇත.

අප්‍රේල් 12 දා ත්‍රිකුනාමලයේ දී දුෂ්ට සිද්ධියක් සිදු විය. සිවිල් වැසියන් 18ක් -- දෙමල වැසියන් හය දෙනෙක්, සිංහල වැසියන් හත් දෙනෙක් සහ මුස්ලිම් වැසියන් හය දෙනෙක් -- සහ සොල්දාදුවකු ඝාතනය කරමින් ජනාකීර්න එලවලු වෙලඳ පොලක් තුල බෝම්බයක් පුපුරුවා හරින ලදි. පිපිරීම සිදු වූ වහා ම සිංහල මැර සේනාවක් දෙමල හා මුස්ලිම් ජනයාට අයත් වෙලඳ සැල් දුසිම් දෙකක් පමන කොල්ල කා ගිනිබත් කලේ ය. එල්ටීටීඊය හා ආන්ඩුව යන දෙපාර්ශ්වය ම මේ සම්බන්ධයෙන් එකිනෙකාට චෝදනා කර තිබේ.

බෝම්බ ප්‍රහාරය ප්‍රදේශයේ වාර්ගික ආතතීන් බොහෝ සෙයින් උත්සන්න කර ඇත. දෙමල වැසියන් 2000ක් පමන අසල පිහිටි ගම්මාන, පාසල් හා කෝවිල් වෙත පලා ගොස් තිබේ. සමහර ගම්මානවල, සිංහල ගොවියන් ද, පලි ගැනීමේ ප්‍රහාරයන්ට බියෙන්, සිය නිවාස හැර ගොස් තිබේ. ආරක්ෂක හමුදාවන් ඇඳිරි නීතිය පැනවීම පිනිස සිද්ධිය යොදා ගෙන ඇත. ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ සහ ඉහල මිලිටරි නිලධාරීහු "ආරක්ෂක තත්වය සමාලෝචනය කරනු" පිනිස ඊයේ ත්‍රිකුනාමලයේ සංචාරයක යෙදුනි.

එල්ටීටීඊය අතීතයේ දී වාර්ගික ප්‍රකෝපකාරී ක්‍රියාවන් සිදු කොට ඇත. කෙසේ වෙතත්, මෙම සිද්ධියේ දී, ඒ සඳහා කවුරු වගකිව යුතු ද යන්න පිලිබඳව බරපතල සැකයන් පවතී. පසු ගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයට අනුව, "පොලීසිය අප්‍රමාදව ක්‍රියාත්මක නො වූ" බවට වානිජ හා කර්මාන්ත මන්ඩලයේ සභාපති ආර්. රාජරම්මෝහන් නිල වසයෙන් පැමිනිලි කලේ ය. ප්‍රදේශයේ පොලිස් මූලස්ථානයට සම්බන්ධිතව හදිසි අනතුරු ඇඟවීමේ පද්ධතියක් බැංකුවේ තිබුනු නමුත්, පොලීසිය විනාඩි 30ක් තිස්සේ නොපැමිනි බව, හැටන් නැෂනල් බැංකු ශාඛාවේ කලමනාකරු කේ. ආරුමුගම් පැවසී ය.

දෙමල පැරා-මිලිටරි කන්ඩායම් හෝ ජවිපෙට, හෙල උරුමයට හෝ උතුරු නැගෙනහිර සිංහල සංවිධානය වැනි වෙනත් කන්ඩායම්වලට සම්බන්ධිත සිංහල අන්තවාදීන් විසින් මෙම බෝම්බ පිපිරීම සංවිධානය කර තිබීමට හොඳින් ම ඉඩ ඇත. මේ සියල්ලන් ම නැගෙනහිර පලාතේ ක්‍රියාකාරීව සිටින අතර ඔවුන්ට ආරක්ෂක හමුදා සමග සමීප සබඳතා ද පවතී. මෙම කන්ඩායම් මෙන් ම, මිලිටරි සංස්ථාපිතයේ කොටස් ද සාම ක්‍රියාදාමයට ගැඹුරින්ම සතුරු ය.

ජවිපෙ, සටන් විරාම ගිවිසුම සංශෝධනය කල යුතු යැයි ද එල්ටීටීඊයට එරෙහිව ප්‍රහාරයන්ට යා යුතු යැයි ද ඉල්ලමින්, ජිනීවා සාකච්ඡාවලට පෙරාතුව ආක්‍රමනශීලී උද්ඝෝෂනයක් ගෙන ගොස් ඇත. එහි දේශපාලන මන්ඩලය අප්‍රේල් 16 දා නිකුත් කල ප්‍රකාශයක් ඉල්ලා සිටින්නේ, "සෑම අයෙක් ම මව්බිම බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ගේන් ගලවා ගැනීම සඳහා එක් විය යුතු බවයි." ආන්ඩුව සහ දේශහිතෛෂී මහජනයා ව්‍යාජ සාමයේ නාමයෙන් ආරක්ෂක හමුදා සාමාජිකයන්ගේ හා නිරායුධ පුරවැසියන්ගේ ජීවිත බිලි ගැනීමට කොටි ත්‍රස්තවාදීන්ට ඉඩ නොදිය යුතු" යැයි එය අවධාරනය කලේ ය.

රටේ 20-අවුරුදු සිවිල් යුද්ධය නතර කරනු පිනිස සාකච්ඡාවන්ට හා සාම ගිවිසුමකට එලඹීමට එකඟ වන ලෙස එල්ල වන තියුනු ජාත්‍යන්තර පීඩනයට එල්ටීටීඊය යටත් කෙරී තිබේ. යුද්ධය කලාපයේ සිය වැඩෙන ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනය කරන බාධාවක් ලෙස සලකන එක්සත් ජනපදය විශේෂයෙන් ම, සාකච්ඡාවන්ට එලඹෙන ලෙස එල්ටීටීඊයට බල කරයි. එක්සත් ජනපදය ශ්‍රී ලංකා මිලිටරි හටයන් මත එල්ල වූ මෑත ම ප්‍රහාරයන් ඒක-පාර්ශ්විකව හෙලා දැක ඇති අතර, ජනවාරියේ දී ප්‍රකාශයක් නිකුත් කරමින්, යලි යුද්ධය ඇවිලුන හොත් තමන් කොලඹ ආන්ඩුවට සහයෝගය දෙන බවට තුනී ලෙස ආවරනිත තර්ජනයක් ද කර තිබේ.

කෙසේ වෙතත්, එමෙන් ම, එල්ටීටීඊය ද දෙමල සුලුතරය අතර සිය බාදනය වෙමින් පවත්නා සහයෝගී පදනම් වර්ධනය කර ගැනීමේ මංමුලා සහගත අවශ්‍යතාවයෙන් පෙලෙයි. තෙවසරක සටන් විරාමයට පසුව, උතුරු හා නැගෙනහිර පලාත්වල වැඩ කරන ජනයාගේ සමාජ කොන්දේසි තව දුරටත් බාදනය වී ඇත්තේ, එල්ටීටීඊයේ බදු හා අත්තනෝමතික පාලනය පිලිබඳ අසන්තෘප්තිය ද වර්ධනය කරමිනි. එහි ප්‍රතිඵලයක් ලෙස, එල්ටීටීඊය සිය පදනම්වලට මුක්කු ගසා ගනු පිනිස වාර්ගික ආතතීන් අවුලුවා සිංහල විරෝධී ස්වෝත්තමවාදයේ පිහිට සොයා ගොස් ඇත.

ජිනීවාහි දෙවන වටයේ සාකච්ඡා ඉදිරියට ගියා වුවත්, මොන යම් හෝ සැලකිය යුතු එකඟතාවකට පවත්නා ඉඩ ප්‍රස්ථාවන් ඉතා අල්ප ය. මොන යම් හෝ සැලකිය යුතු මට්ටමේ සහනයක් දීමට එකදු පාර්ශ්වයකට වත් ඇති නොහැකියාව පිලිඹිබු කරන්නේ, වැඩ කරන ජනතාව භේද කිරීම හා සිය හෙලත්තාඩු පාලනය පවත්වා ගෙන යාම පිනිස වසර 50කට අධික කාලයක් තිස්සේ ඔවුන් පාදක වී ඇති වාර්ගික දේශපාලනයෙන් බිඳී ගැනීමට ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවේ කිසිදු කන්ඩායමකට ඇති අති මූලික නොහැකියාව යි.

© www.wsws.org